**ශීර්ෂය 122 - ඉඩම් අමාත්‍යාංශය**

------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

ඉඩම් අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කලමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම් ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.2 ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණය සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.44,880,064 ක් වශයෙන් දක්වා තිබුණද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව වර්ෂයේ මිලදී ගැනීම් රු.285,340 ක් ලෙස දක්වා තිබීමෙන් රු.44,594,724 ක වෙනසක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර මුද්‍රිතය සමඟ සැසඳී තිබිය යුතු වීම. | එකඟ වෙමි. නිවැරදි කර ඉදිරිපත් කරමි. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ - 6)ආරම්භක ශේෂය රු.551,851,474 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව ආරම්භක ශේෂය රු.544,387,120 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.7,464,354 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එහි ඇතුළත් අගයන් භාණ්ඩාගාර අවසන් මුද්‍රිත සටහන්වල අගයන් හා සැසඳී තිබිය යුතු වීම. | එකඟ වෙමි. නිවැරදි කර ඉදිරිපත් කරමි. |

### 1.6.3 ලේඛන පොත්පත් පවත්වා නොතිබීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) උප පත්‍රිකා පොත් ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දීමට පියවර ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) හානි හා පාඩු ලේඛනය<br>--------------------------- | | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | හානි පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට සටහන් කර ගතිමි. | |

**1.6.4 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම**

**---------------------------------------------**

නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

**විගණන නිරීක්ෂණය**

----------------------

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | --------------- | ------------------ | -------------- | -------------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මුදල් රෙගුලාසි 371(5) | රෙගුලාසි ප්‍රකාරව නිකුත් කරන ලද තත්කාර්ය අතුරු අග්‍රිමයක් අදාළ කාර්යය නිම කර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවත්, අතුරු අග්‍රිමය පියවීමට දින 24 සිට දින 238 දක්වා කාල පරාසයක් ගත කර තිබූ බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ කාලය තුළ පියවීම කළ යුතු වීම. | ප්‍රමාදය වලක්වා ගෙන ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කරන ලෙස අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දීමට පියවර ගනිමි. |
| | (ii) මුදල් රෙගුලාසි 104(3)හා (04) | රෙගුලාසි ප්‍රකාරව හානියකදී/අනතුරකදී පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 7 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම එවිය යුතු අතර පරික්ෂණයෙන් පසු අලාභය සිදුවූ දින සිට තුන්මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර ප්‍රමාද කාලය මාස 09 ක සිට මාස 14 ක් දක්වා පරාසයක් විය. | අදාළ කාලය තුළ පරීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කළ යුතු වීම. | ඉදිරියේදී වාර්තා ලබා දීමට කටයුතු යොදා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.3 ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා අමාත්‍යාංශය විසින් ක්‍රමවේදයක් සකස් කළයුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. | ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. | නව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වා සිටිමි. |

**2 මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාග්ධන වැය විෂයයන් 8 ක හා පුනරාවර්තන වැය විෂයයන් 6 ක රු.398,998,000ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.115,453,445ක මුදලක් ඉතිරි වී තිබුණි. ඉතිරියේ ප්‍රතිශතය සියයට 35ක සිට සියයට 92ක් දක්වා පරාසයක විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් පිළිබඳ නිසි අධ්‍යයනයකින් පසු ප්‍රමාණවත් පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතුවීම. | අපේක්ෂා කළ පරිදි වියදම් අවස්ථා ඇති නොවුණි. |
| (ආ) ප්‍රාග්ධන වැය විෂයයන් 3 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 3 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.108,904,000 ක මුදලක් අනුමත කර තිබුණද, එම ප්‍රතිපාදනය කිසිදු කාර්යයකට නොයෙදීම නිසා සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | -එම- | අපේක්ෂා කළ පරිදි වියදම් අවස්ථා ඇති නොවීම හා අරපිරිමැස්මෙන් පරිහරණය කිරීම නිසා විශාල වියදම් සිදු නොවීම. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා කිසිදු වියදමක් හෝ බැඳීමක් ඇතිකර නොගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් වැය විෂයයන් 06 ක් | සලසා ඇති ප්‍රතිපාදන ඉක්මවා කිසිදු බැඳීමක් ඇති කර නොගත යුතු වීම. | විදුලි, ජල හා වෙනත් බිල්පත් ගෙවීම සඳහා ඉදිරිපත් වනුයේ ඊළඟ වර්ෂයේ බැවින්ද මන්ත්‍රීවරුන් විසින් |

| | | | |
|---|---|---|---|
| | සඳහා ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.7,730,048 ක බැරකම්වලට එළඹ තිබුණි. | | අලුත්වැඩියා කටයුතු නියෝජිත ආයතන වලින් සිදු කරන නිසා ගෙවීමට ඇති මුදල වැඩි වී ඇති බැවින්ද මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත් වීමෙන් පසු ගෙවීම් සිදු කළ යුතු බැවින්ද බැරකම් ලේඛනයට ඇතුළත් කර ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාරය වෙත වාර්තා නොකළ ඉකුත් වර්ෂයේ බැදීම් හෝ බැරකම් නිරවුල් නොකළ යුතුයි. එසේ වුවද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු සමාලෝචිත වර්ෂයට අදාල රු.2,515,122 ක බැරකම් 2020 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | භාණ්ඩාගාරය වෙත වාර්තා නොකළ බැදීම් හෝ බැරකම් පෙර වර්ෂයේ වියදම් ලෙස ඊට පසු වර්ෂයේ නිරවුල් නොකළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශ සකස් කරන අවස්ථාවේදී දෙසැම්බර් මස වවුචර් පත්‍ර ඉදිරිපත් වී නොමැති අතර නොවැම්බර් මාසයට අදාළ වවුචරය ඉදිරිපත් වී තිබුණද එය ප්‍රමාද දෝෂයකින් බැරකම් ලැයිස්තුවට ඇතුළත්ව නොමැත. ඉදිරියේදී බැරකම් ලැයිස්තුවට සියලුම නොගෙවූ වවුචර් ඇතුළත් කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම**

----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | ---------------------------- |
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් බී ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනයේ කේවල ණය ශේෂය, සාමාජික ණය ලේඛනයේ 2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස සටහන් විය යුතුයි. එසේ වුවද නිලධාරීන් 5 දෙනෙකුගේ ණය ශේෂ අතර රු.200,140 ක වෙනසක් නිරීක්ෂණය විය. | පසුගිය වර්ෂ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ආ යුතු වීම. | වාරික ලැබීම් සටහන් කිරීමේ ප්‍රමාදයක් සිදු වී ඇති අතර අනාවරණය වීමෙන් පසුව ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.129,045 ක ආපදා ණය ශේෂයන් මාස 06 ක කාලයක සිට අය නොවී පැවතුණි. | ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ නිරවුල් කරගත යුතු වීම. | මේවන විට එම ණය ශේෂ අදාළ කාර්යාල සම්බන්ධ කර අය කිරීමට අදාළ කටයුතු යොදා ඇත. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) බිම් සවිය වැඩසටහන සඳහා රු.420,000,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර ඒ යටතේ රු.307,795,285 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා සකසන ලද ක්‍රියාකාරී සැලැස්මේ බිම්සවිය වැඩසටහන යටතේ සැලැසුම් කළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) හිමිකම් විමර්ශණ නිලධාරීන්, නීති හා බැංකු නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරු ඇතුළු නිලධාරීන් 600 ක් , පළාත් පාලන ආයතන ප්‍රධානීන් 100 ක්, ග්‍රාම නිලධාරීන් ඇතුළු ක්ෂේත්‍රගත නිලධාරීන් 500 ක් සඳහා බිම් සවිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් නොපැවැත්වීම. | ක්‍රියාකාරී සැලැස්ම පරිදි සැලසුම් කළ ක්‍රියාකාරකම් ඉටුකළ යුතු වීම. | පුනරාවර්තන විෂය යටතේ වෙන්වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ අදාළ නිලධාරීන් සම්බන්ධීකරණය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස අදාළ ප්‍රාදේශීය ආයතන වලින් ඉල්ලීම් කිහිපයක් කළද, ඒ සඳහා නිසි අනුග්‍රහයක් නොලැබීම හේතුවෙන් එම වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. |
| (ii) පරිගණක සහ ජාලගත තොරතුරු පදනමක් පවත්වා නොගැනීම. | - එම - | අවශ්‍ය වන යටිතල පහසුකම් (භාණ්ඩ හා උපකරණ) සපයා ගැනීම, අංක 122-2-3-4-2105 දරන වැය ශීර්ෂයෙන් සිදුකළ නොහැකි බව අනාවරණයවූ බැවින් එම වියදම් දැරීමට නොහැකි විය. |
| (iii)ඉඩම් ප්‍රතිපත්ති අංශය මගින් පනත් 03ක් සංශෝධනය කිරීම සම්බන්ධව අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් නීති කෙටුම්පත් හා නිරීක්ෂණ ලබා නොගැනීම. | - එම - | ඉඩම් සංවර්ධන ආඥා පනත අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය. රජයේ ඉඩම් බැංකු පනත ඉදිරි කටයුතු සිදුකර නැත.ජාතික ඉඩම් ප්‍රතිපත්ති පනත සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී සංශෝධනය කරමින් පවතී. |

(ආ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රජයේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ඉඩම් පෞද්ගලික අංශයෙන් අත්පත් කර ගැනීමේ ප්‍රගතියට අදාළව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) 2019 වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක ගොනු ගණන 8,409ක් වූ අතර, වන්දි ගෙවා වැඩ අවසන් ගොනු ගණන 315 ක් පමණක් විය. | කාර්යක්ෂම අත්පත් ක්‍රියාවලියක් හඳුන්වාදීම හා ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවීමට කටයුතු කළ යුතු වීම. | අත්පත් ක්‍රියාවලිය ආයතන රාශියකගේ දායකත්වය ලබමින් සිදුකරන සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් ගොනුවකට අදාළ සියලුම ඉඩම් කොටස්හි වැඩ අවසන් කිරීම සඳහා සෑහෙන කාලයක් ගතවේ. 2019 වර්ෂය තුළ වැඩ අවසන් කළ ගොනු ගණන 21කි. |
| (ii) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38 (අ) අතුරු විධාන ආඥාව නිකුත් කර අවසන් ගොනු සංඛ්‍යාව 1257 ක් විය. එම ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් පොළිය ලෙස ගෙවීමට සිදු වන බව නිරීක්ෂණය විය. | කාර්යක්ෂම අත්පත් ක්‍රියාවලියක් හඳුන්වාදීම හා ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවීමට කටයුතු කළ යුතු වීම. | අක්‍රිය ගොනු ලෙස හඳුනාගත් අත්කර ගැනීම්හි වර්තමාන තත්ත්වය විමසා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත සිහිකැඳවීම් යොමුකිරීමට මේ වන විට පියවර ගෙන ඇත. පොලී සඳහා සිදුකරන අනවශ්‍ය වියදම් වලක්වා ගැනීමට 38(අ) අතුරු විධානය නිකුත්කළ දිනය පදනම් කරගනිමින් වන්දි ගෙවීමට ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස්කර ඒ අනුව වන්දි මුදල් සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීමේ ක්‍රමවේදය මෙම වර්ෂයේ සිට ක්‍රියාත්මක කර ඇත. |
| (iii) ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධයෙන් වන්දි මුදල් ගෙවීමට ප්‍රමාද වීම් දිගින් දිගටම සිදු වී තිබූ අතර 2019 වර්ෂයේදී වන්දි මුදල් රු.2,410,374,671 ක් හා රු.920,543,193 ක පොළී මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ ගෙවූ පොළී මුදලින් සියයට 84 ක් වර්ෂ 22කට වැඩි කාලයක් ගත වූ අත්පත් කර ගැනීම් වෙනුවෙන් විය. | කාර්යක්ෂම අත්පත් ක්‍රියාවලියක් හඳුන්වාදීම හා ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවීමට කටයුතු කළ යුතු වීම. | අත්කර ගැනීමේ කටයුතු පසුවිපරම් කිරීම සඳහා ICTA ආයතනයේ උපදේශකත්වයද ලබාගනිමින් තොරතුරු පද්ධතියක් සකස් කිරීමට අවශ්‍ය මූලික පියවර ගනිමින් පවතී. |

| | | |
|---|---|---|
| (iv) සමාලෝචිත වර්ෂයේදී ඉඩම් 290ක් අත්පත් කරගැනීම සඳහා සැලසුම් කර තිබූ නමුත් ඉඩම් 112 ක් පමණක් අත්පත් කරගෙන තිබීමෙන් භෞතික ප්‍රගතිය සියයට 38.6 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි. | කාර්යක්ෂම අත්පත් ක්‍රියාවලියක් හඳුන්වාදීම කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |

## 3.2 කළමණාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|
| 1950 අංක 09 දරන ඉඩම් පනතේ 38(අ) අතුරු විධාන ආඥාව පරිදි රජයේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඉඩම් පුද්ගලික අංශයෙන් අත්පත් කර ගැනිමේ ක්‍රියාවලිය ඉඩම් අමාත්‍යාංශය, සංවර්ධන කටයුත්ත ක්‍රියාත්මක කරන ආයතනය, තක්සේරු දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව එක්ව සිදුකරනු ලබයි. 2015 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය තුළ එසේ අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා 38(අ) ආඥාව යටතේ 54 ක් හා 38(අ) අතුරු විධාන ආඥාව යටතේ 1257 ක් වශයෙන් නිකුත්කර අවසන් කර තිබූ ගොනු 1311 කින් කටයුතු නිම කිරීමට හැකිව තිබුණේ ගොනු 315 ක් තරම් අඩු ප්‍රමාණයක් පමණි. | අමාත්‍යාංශය අත්පත් ක්‍රියාවලිය නියාමනය හා ක්‍රියාත්මක කරවන ආයතනය වන නිසා කාල නිර්ණයන් සමග නිසි ක්‍රමවේදයක් සකස් කිරීම මගින් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කිරීම හා ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවීමට කටයුතු කළ යුතු වීම. | අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආයතන රාශියකගේ දායකත්වය ලබමින් සිදුකරන සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් ගොනුවකට අදාළ සියලුම ඉඩම් කොටස්හි වැඩ අවසන් කිරීම සඳහා සෑහෙන කාලයක් ගතවේ. |

**3.3** **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|
| (අ) කළුතර වලතර කනිටු විදුහලට ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා ඉඩමක් අත්කර ගැනීම | | |
| ඩෝරා ජයසූරිය යන අයට අයත් අක්කර 01 රූඩ් 03 පර්චස් 34.5ක් මහජන කාර්යයක් සඳහා පවරා ගන්නා බවට දැන්වීම 2005 ජූලි මාසයේදී දැන්වීම් පළ කර තිබුණි.එසේ වුවද 2005 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 14 ක පමණ කාලයක් ගත වුවත් ඉඩම අත්පත් කර ගැනීමේ ඉදිරි කටයුතු කිසිවක් සිදු කර නොතිබූ අතර, කළුතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් යෝජිත ඉඩම දැනටමත් පාසලේ කටයුතු සඳහා පරිහරණය කරන බැවින් තවදුරටත් පාසල සඳහා ඉඩම අවශ්‍ය බවට දන්වා තිබුණි. | අත්පත් ක්‍රියාවලිය අවසන් කර ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවිය යුතු වීම. | 2005 ජූලි 20 දින 2 වගන්තියේ දැන්වීම පළ කර ඇතත් පරිගණක ගත පද්ධතියෙන් ලබා ගත් වාර්තාවෙන් සටහන අනුව අක්‍රිය ගොනුවක් ලෙස සලකා කටයුතු කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/05/69/02/08/423 දරන ලිපිය මඟින් මෙම ඉඩම පාසල විසින් තවදුරටත් පරිහරණය කරන බැවින් උක්ත ඉඩම අත්කර ගැනීම සඳහා නව අත්කර ගැනීමක් යටතේ කටයුතු කිරීමට අයදුම් පත්‍රය යොමු කරන ලෙස දන්වා ඇතත් එම අත්කර ගැනීමේ යෝජනාව එවා නොමැත.එම යෝජනාව නැවත ඉදිරිපත් කරන තුරු අත්පත් ක්‍රියාවලිය ඉදිරියට ගෙන යා නොහැක. |
| (ආ) ගාල්ල බද්දෙගම තොරතුරු තාක්ෂණය පිළිබඳ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම. | | |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 05ක් පමණ වූ මෙම ඉඩම අත්පත් කර ගැනීමට අදාළව මහජන කාර්යයක් සඳහා පවරා ගන්නා බව ප්‍රසිද්ධ කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ 2000 වර්ෂයේදී දැන්වීම පළකර 2001 වර්ෂයේදී 38 | අත්පත් ක්‍රියාවලිය අවසන් කර ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවිය යුතු වීම. | මුදල් රෙගුලාසි 53 යටතේ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය 2010 වර්ෂයේදී ලැබී ඇතත් වන්දි ගෙවීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රතිපාදන අයදුම්පත යොමුකර ඇත්තේ 2019 ජූනි 01 දිනදීය. ඒ අනුව 2020 |

| | | | |
|---|---|---|---|
| | (අ) අතුරු විධානය යටතේ ආඥාව නිකුත් කර බුක්තිය පවරා දී තිබුණි. නමුත් විගණිත දිනය වූ 2020 ජනවාරි දක්වාම රු.8,000,000ක වන්දි මුදල් ගෙවීමට කටයුතු කර නොතිබූ අතර 2001 වර්ෂයේ සිට වර්ෂ 18 ක් සඳහා සියයට 7 බැගින් රු.10,080,000ක පොළී මුදලක් ගෙවීමට සිදු වන බව නිරීක්ෂණය විය. | | වර්ෂයේ වන්දි ගෙවීම සඳහා අනුමැතිය ලැබී ඇතත් ප්‍රතිපාදන නොමැතිවීම මත වන්දි ගෙවා නැත.මෙම වසරේදී ප්‍රතිපාදන වෙන් වූ පසු වන්දි ගෙවීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | මතුගම ආනන්ද ශ්‍රාස්ත්‍රාලය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.<br>-------------------------------------- | | |
| | නාගරික සංවර්ධන අධිකාරියට අයත් පර්චස් 32.91 ක ඉඩම 2004 සැප්තැම්බර් මාසයේදී 38(අ) අතුරු විධානය යටතේ ආඥාව නිකුත් කර තිබූ නමුත් වර්ෂ 15 ක් ගත වන තුරුත් ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි. | අත්පත් ක්‍රියාවලිය අවසන් කර ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවිය යුතු වීම. | අත්කර ගැනීමේ වන්දි මුදලට අදාළ ප්‍රතිපාදන 2019 අප්‍රේල් 29 දිනැතිව ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර ඇත. වන්දි ගෙවීම අවසන් කර පොළී ගෙවීම සඳහා ප්‍රතිපාදන අයදුම්පත අත්කර ගැනීමේ නිලධාරී විසින් ඉදිරිපත් කිරීමෙන් පසුව ඉදිරියේදී ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. |